# ගරු කථානායකතුමාගේ නිවේදනය

2015 සැප්තැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතුවල දැක්වෙන විෂය අංක 1 සිට 6 දක්වා වන 2013 අංක 36 දරණ විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32, 33, 34, 35 හා 36 දරණ නියමයන් සහ අත්තිකාරම් ගිණුම් සීමා වෙනස් කිරීමේ විධානය අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම් වූ අවස්ථාවේදී ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද රීති ප්‍රශ්නය පිළිබඳව මාගේ තීරණය දැනුම්දීමට කැමැත්තෙමි.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තියේ නියමයන්ට අනුව 2015 මැයි මස 31 වැනි දාට ප්‍රථමව පමණක් විෂය භාර අමාත්‍යවරයාට අදාළ වෙනස් කිරීම් කිරීමට හැකියාවක් ඇති බවත් එය පාර්ලිමේන්තුව විසින් එදිනට පෙර පමණක් අනුමත කරගත හැකි බවත් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කරමින් පෙන්වා දෙන ලදී.

මෙම කරුණ පිළිබඳව මවිසින් හොඳින් අධ්‍යයනය කරන ලද අතර, අවශ්‍ය නීති උපදෙස් ද ලබාගත්තෙමි.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය පහත සඳහන් පරිදි වේ.

*"8 (1) අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමැතිය ඇතිව මේ පනතේ තෙවන උපලේඛනයේ*

*(අ) II වන තීරයේ IV වන තීරයේ සහ V වන තීරයේ දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්;*

*(ආ) III වන තීරයේ දැක්වෙන අවම සීමා;*

*නියමයක් මගින් 2015 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ විවර්තනය කිරීම හෝ කරනු ලැබිය හැකිය.*

*(2) 1 වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස බල නොපැවැත්විය යුතුය.*

*(3) 1 වන උපවගන්තිය යටතේ යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක දී ද ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එකී ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතුය. "*

ඒ අනුව 2013 අංක 36 දරණ විසර්ජන පනතේ 8 වැනි වගන්තියේ වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාට 2015 මැයි මස 31 වන දිනට ප්‍රථම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව තෙවන උපලේඛනයේ සඳහන් උපරිම සීමා සහ අවම සීමාවන් වෙනස් කිරීම හෝ විවර්තනය කිරීමට බලයක් ඇත.

ඒ අනුව ගරු මුදල් අමාත්‍යවරයා විසින් -

- විෂය අංක 30602 දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව

සීමාවන් වෙනස් කිරීම සඳහා 2014 ඔක්තෝබර් මස 9 වන දිනද

- විෂය අංක 24702 අත්අඩංගුවට ගන්නා ලද හෝ රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම

- විෂය අංක 21302 පොත් මුද්‍රණය ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම
- විෂය අංක 31002 ගබඩා අත්තිකාරම් ගිණුම
- විෂය අංක 31003 කළ වැඩ අත්තිකාරම් ගිණුම
    - o යන ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම පිළිබඳව 2015 මාර්තු මස 18 වන දිනද
- රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම
    - o සම්බන්ධ සීමාවන් වෙනස් කිරීම සඳහා 2015 අප්‍රේල් මස 01 වන දිනද

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

එසේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව ගරු මුදල් අමාත්‍යවරයා විසින් එකී වෙනස් කිරීම් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට අදාළ යෝජනා 2015 අප්‍රේල් මස 21 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, හත්වැනි පාර්ලිමේන්තුව විසිරුවා හරින දිනය තෙක් මෙම යෝජනාවන් පාර්ලිමේන්තුව විසින් සම්මත කොට නොතිබුණු බව ම විසින් තහවුරු කරගන්නා ලදී.

ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2015 සැප්තැම්බර් මස 09 වන දින මෙකී සියළු යෝජනාවන් යළිත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන 2015 සැප්තැම්බර් මස 23 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට යෝජනා සම්මත කරගැනීමට පියවර ගෙන තිබුණි.

2013 අංක 36 දරණ විසර්ජන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් අදාළ සියළුම අත්තිකාරම් ගිණුම්වල සීමාවන් වෙනස්

කිරීමට හෝ විවර්තනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2015 මැයි මස 31 වැනි දිනට ප්‍රථමව ලබාගෙන ඇති බව තහවුරු වේ.

2013 අංක 36 දරණ විසර්ජන පනතේ 8 වැනි වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව එබඳු නියමයක් බලපැවැත්වීමට නම් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම අත්‍යවශ්‍ය කරුණක් වුවද, එයට කාල සීමා නියමයක් පෙර කී පනතේ නිශ්චිතව දක්වා නොමැත.

එසේ හෙයින්, ගරු මුදල් අමාත්‍ය වරයා විසින් 2013 අංක 36 දරණ විසර්ජන පනතේ 8 වැනි වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති බවත්, නිශ්චිත වශයෙන් දැක්වෙන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නියමිත කාල සීමාව ඇතුළත ලබාගෙන ඇති බවත් ඒ අනුව, 2015 සැප්තැම්බර් මස 23 වැනි දින න්‍යාය පත්‍රයේ ඇතුළත් කර තිබූ දිනට නියමිත කටයුතු වල අංක 1 සිට 6 දක්වා විසර්ජන පනත යටතේ වූ යෝජනා පිළිබඳව එදින ආරම්භ කරන ලද විවාදය, තවදුරටත් පවත්වාගෙන ගොස් අදාළ යෝජනා හය (6) සභාවේ සම්මත කරගැනීමට හැකි බව දන්වා සිටිනු කැමැත්තෙමි.